සියලුම හිමිකම් ඇවිරිණ
All Right Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## අවසාන වාර පරීක්ෂණය 2022 (2023)
## 3 rd Term Test 2022

11 ශ්‍රේණිය
Grade 11

## සිංහල භාෂාව හා සාහිත්‍යය II

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.

01. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ **පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) පහත සඳහන් පදවල අර්ථ පැහැදිලි වන සේ වාක්‍ය **දෙකක්** ලියන්න.

අ) අඹ　　　　ආ) අබ

(ii) පහත සඳහන් පද විසන්ධි කර ලියන්න.

අ) දැඟිලි　　　　ආ) සුරත

(iii) පහත සඳහන් වාක්‍යයේ අක්ෂර වින්‍යාස දෝෂ සහිත වචන දෙකක් ඇත. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

කණිෂ්ඨ නිලධාරියකු වූ ඔහු තම රාජකාරිය නීත්‍යානුකූලව සිදු කරමින් ජනතා ප්‍රසාදය දිනාගත්තේ ය.

(iv) පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

අ) වැරදි දෘෂ්ටි දරන්නා

ආ) තමාට සමාන කෙනකු හෝ තමාට උසස් කෙනකු හෝ නැති

(v) පහත සඳහන් වාක්‍ය සදොස් ය. ඒවා නිදොස් කර ලියන්න.

අ) එක් සිසුවෙක් පන්තියට පැමිණ නැත.

ආ) ගුරුවරු හොඳින් උගන්වති'යි දෙමව්පියෝ සිතති.

(vi) පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය නම් කරන්න.

අ) හිරු **නැඟෙත** පිණි බිඳු වියළී ගියේ ය.

ආ) පැරකුම්බා නරනිඳු සඳ **දකු** මිතුර

(vii) පහත සඳහන් වාක්‍යයේ ඇතුළත් උපසර්ග පද **දෙකක්** උපුටා දක්වන්න.

මෙවර විභාගයෙන් උසස් ජයක් ලබා වැඩිදුර අධ්‍යාපනය සඳහා විදෙස්ගත වීමට නදිකා අදිටන් කර ගත්තා ය.

(viii) පහත සඳහන් පද අයත් වන සමාස ප්‍රභේදය ලියන්න.

අ) අප්‍රමාණ

ආ) ඇත්දළ

(ix) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

අ) ශිෂ්‍ය සංවිධානයේ සාමාජිකයෝ ශිෂ්‍ය නායකයන් අගයති.

ආ) කෘෂි පරීක්ෂකයෝ වගා නිලධාරීන් දිරිමත් කළහ.

(x) පහත සඳහන් යෙදුම්වල පළමුවැනි හෝ දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමුවැනි වචනය හෝ දෙවැනි වචනය හෝ සකස් කර ලියන්න.

අ) පුණ්‍ය බිම

ආ) කල්‍යාණ මිතුරා

(ලකුණු 02 × 10 - 20 යි)



EXAMRESULTS.LK

02. පහත දැක්වෙන (අ),(ආ),(ඉ),(ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට **නො අඩු** වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) පෙරදිග ධාන්‍යාගාරය ලෙස විරුදාවලි ලත් ස්වයං පෝෂිත රටක් ලෙස වැජඹුණු ශ්‍රී ලංකාව අද බොහෝ අර්බුදවලට මුහුණ දෙමින් සිටියි. රට තුළ පවත්නා විදුලි අර්බුදය ද එවැන්නකි. විවිධ අකාර්යක්ෂමතා හා අවිධිමත් කළමනාකරණය මීට මූලික හේතු වේ. විදුලි අර්බුදය හේතුවෙන් කර්මාන්ත ලක්ෂ ගණනකට බලපෑම් එල්ලවන අතර ඒ තුළින් විශාල පිරිසකට රැකියා අහිමිවීම සිදු වේ.මේ සඳහා විකල්ප ක්‍රමවේද මඟින් විදුලි අර්බුදයට විසඳුම් ලබා ගත හැකි ය. එමඟින් බොහෝ ගැටලු මග හැරෙයි.

(ආ) ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය ව්‍යාප්තියට ශ්‍රී ලංකාව ද ගොදුරු වී තිබේ. මෙරටහි ද ජාවාරම්කරුවන් හා ඔවුන්ගේ ගෝලයන් පසුගිය වකවානුවේ විශාල ලෙස නීතියට කොටුකර ගැනීමට අවස්ථාව ලැබිණි. දේශීය ජාවාරම්කරුවන් අත්අඩංගුවට ගැනීමෙන් රට තුළ මත්ද්‍රව්‍ය පැතිරී යන වේගය අවම කර ගැනීමට හැකියාව ලැබේ. මෙම උවදුරෙන් පාසල් යන වයසේ දරුවන් ගලවා ගැනීමට සැවොම වගබලා ගත යුතු ය.

(ඉ) අතීතයේ ලංකාව සාරධර්ම අතින් අනූන රටකි. නමුත් වර්තමානය වන විට එහි පිරිහීමක් දක්නට ලැබීම කනගාටුවට කරුණකි. සාරධර්ම අධ්‍යාපනය මඟින් යළිත් මේ තත්ත්වය නඟා සිටුවීමට අවධානය යොමු වී ඇත. වර්තමානයේ පාසල් මට්ටමින් සිසුන් සතිමත් බවේ පිහිටුවන සති පාසල වැනි වැඩසටහන් මෙන් ම සාරධර්ම ඇති කරවන ආගමික වැඩසටහන් කෙරෙහි අවධානය යොමු වෙමින් පවතී. සමස්ත සිසු පරපුර ම මේ සඳහා හුරුකරවීමෙන් නිවස, පාසල, සමාජය වඩාත් සුගතිගාමී වනු ඇත.

(ඊ) සාහිත්‍ය හදවත හා සමාන වේ. ශ්‍රී ලංකාවේ තවමත් ළමා සාහිත්‍ය නිර්මාණ බිහිවීමේ මඳ බවක් තිබේ. දරුවන් තාක්ෂණික උපකරණවලට යොමුවීම, රසඥතාව අඩුවීම හා විභාග කේන්ද්‍රීයත්වය ආදී කරුණු මීට බලපා ඇත. ළමා නිර්මාණකරණයට ළමයින් පෙළඹවීම ඉතා වැදගත් වේ. එවිට ඔවුන්ගේ අභ්‍යන්තරයේ පවතින යහගුණ ලොවට කියාපෑමට අවස්ථාව උදා වේ. ඒ නිසා ඔවුන් උනන්දු කරවීමේ මාර්ග තව තවත් පුළුල් විය යුතු ය.

(ලකුණු - 25 යි)

03. පහත දැක්වෙන පාඨය වචන (65-75) අතර වන සේ **සාරාංශ** කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ජාතක කතා පරිශීලනය කරන විට පැරණි භාරතීය සමාජයේ පවුල් සංස්ථාව, අධ්‍යාපනය, සමාජ ජීවිතය, චාරිත්‍ර වාරිත්‍ර , ජීවනෝපායන් යනාදී බොහෝ කරුණු පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි ය.එහෙත් එම තොරතුරු හුදෙක් භාරතීය සමාජයට පමණක් සීමා නොවී පොදු ජන ජීවිතය කෙරෙහි බලපාන අයුරින් ලියා ඇති නිසා ලක්දිව බෞද්ධයාට වඩාත් සමීප වී ඇත. කියන විට අසා සිටින්නාට මහත් හරයකින් යුතු දේශනයක් දීමේ අරමුණු කතා තුළ ගැබ් විය. එබැවින් කාලය, දේශය පිළිබඳ සිතුවිල්ල ශ්‍රාවකයාට එහිදී වැදගත් නොවේ. එමෙන් ම ඇතැම් විට සත්ත්ව චරිත ආදිය කතා කරන ආකාරය, හැසිරෙන ආකාරය, විවිධ වෙස් මවා ගන්නා ආකාරය අභව්‍ය සිදුවීම් ලෙස ගෙන හැර දැක්වුව ද කතා රසය මුල් වීම නිසා එහි සත්‍යාසත්‍යතාව සොයා බැලීම ද වැදගත් නොවූ බව පෙනේ.

ජාතක කතා පිළිබඳ විමසා බලන විට නූතන ජීවිතය වැදගත් අංගයක් වූ අධ්‍යාපන ක්‍රමය සිදුවූ අයුරු ද අනාවරණය කර ගත හැකි ය. බොහෝ කතාවල දිසාපාමොක් ඇදුරු මූලික කරගත් තක්සලා නුවර අධ්‍යාපනයක් හා ගුරු ගෝල සබඳතා පිළිබඳ තොරතුරු ඇතුළත් වේ.වර්තමාන අධ්‍යාපන ක්‍රමයට වඩා තරමක් වෙනස්කම් එහි දැකිය හැකි ය. එහි වූයේ සදාචාර හා ආධ්‍යාත්මික සංවර්ධනයට යොමු වූ ගුරුවරයාගේ පරිශ්‍රයෙහි නැවතී, ගුරු පඬුරු ලබා දෙමින්, උපස්ථාන කරමින්, ගෙදර දොර කටයුතු මනාව කරමින් ශිල්ප ශාස්ත්‍රයෙහි යෙදීම යි. වනපොත් කිරීම හෙවත් කටපාඩම් කිරීම එකල අධ්‍යාපනයේ මූලික ක්‍රමවේදය විය.

(ලකුණු - 10 යි)

04. පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.

ෆ්‍රොයිඩ්ට අනුව මනෝවිශ්ලේෂණය සිදුවන්නේ කථනය හෙවත් වාචික අදහස් ප්‍රකාශනය පදනම් කොට ගෙන ය. මෙහි ලා නිදහස් අදහස් සංඝටන වැනි ශිල්ප ක්‍රම භාවිත කෙරේ. එනිසා ළමයින් මනෝවිශ්ලේෂණයට භාජනය කළ නොහැක්කේ ඔවුන්ට තම අදහස් නිදහසේ ප්‍රකාශ කිරීමට තරම් භාෂා හැකියාවක් නොමැති බැවින් බව ෆ්‍රොයිඩ් පෙන්වා දී ඇත. එහෙත් සිය පියාගේ මෙම අභියෝගය භාරගත් ඇනා දියණිය ළමයින් පිළිබඳ විශේෂ අවධානයට ලක් කළා ය. මීට සමාන්තර ව මෙකල ලෝක යුද්ධයේ ප්‍රතිඵල වශයෙන් ළමයි විශාල වශයෙන් අනාථ වීම හා මානසික අවප්‍රමාණ ගතවීමට බඳුන් වූහ. එවැනි ළමයින් යළි පුනරුත්ථාපනය කිරීමේ දැඩි අවශ්‍යතාවක් ඉස්මතු වන්නට විය. එවැනි පසුතල තත්ත්වයක් මත ඇනා ෆ්‍රොයිඩ් ළමා අධ්‍යාපනය දෙසට හැරිණි. ඇය සිය වෘත්තිය ජීවිතය ආරම්භ කළේ ප්‍රාථමික පාසලක ගුරුවරියක වශයෙනි. අනතුරු ව වෛද්‍යවරියක වශයෙන් ද සේවය කර ඇති නිසා ඇයට ළමා සායනය පිළිබඳ හොඳ පසුතල අවබෝධයක් තිබිණ. ඒ සමඟ ම මාරියා මොන්ටිසෝරි මැතිණියගේ පූර්ව පාසල් අධ්‍යාපන සංකල්ප හදාරා තිබූ ඇයට පූර්ව පාසල් අධ්‍යාපනය ගැන මෙන් ම ප්‍රාථමික පාසල් අධ්‍යාපනය ගැන ද මනා අවබෝධයක් තිබිණ. ළමයින් උදෙසා ඇප කැප වීමට ඇයට මේ පසුබිම් දැනුම හොඳට ම ප්‍රමාණවත් විය. එමගින් ඇය ළමා මනෝ විද්‍යාවට විශාල සේවයක් ඉටුකර ඇත. එහෙත් ඇය කිසිදිනෙක විවාහ වූයේ හෝ දරුවන් වැදුවේ නැත.

එවකට පොදුවේ බටහිර සංස්කෘතිය තුළ ළමයින් සම්බන්ධයෙන් එතරම් දැඩි අවධානයක් නොවූයේ ය. එහි ප්‍රතිඵලය වූයේ යුරෝපීය ළමයින්ට දැඩි දඬුවම් පැමිණ විම, ළමයින් දෙමව්පියන්ගෙන් වෙන්කොට නේවාසික පාසල්වල රැඳවීම හෝ නේවාසික කිරීම වැනි තත්ත්වයක් යටතේ ඇනා ෆ්‍රොයිඩ් ළමා මනස විද්‍යාත්මක ලෙස තේරුම් ගැනීමට සමත් වීමෙන් ළමා ලෝකයේ ප්‍රගමනය සම්බන්ධයෙන් විශාල සේවාවක් කළ මනෝ වෛද්‍යවරියක බවට පත් වූවා ය.

1. ළමුන් මනෝවිශ්ලේෂණයට බඳුන් නො කිරීමට හේතුව ලෙස දැක්වෙන්නේ කුමක් ද ?
2. මෙහි දැක්වෙන ආකාරයට ලෝක යුද්ධයෙන් පසු දරුවන්ට අත් වූ ඉරණම කුමක් ද ?
3. ඇනා ෆ්‍රොයිඩ් හා ෆ්‍රොයිඩ් අතර ඇති ඥාති සම්බන්ධය කුමක් ද ?
4. ඇනා ෆ්‍රොයිඩ්ට ළමා මනෝවිද්‍යා ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මනා අවබෝධයක් ලබා ගැනීම පහසු වූයේ කවර හේතු නිසා ද ?
5. බටහිර සංස්කෘතිය තුළ දරුවන් පිළිබඳව අවධානය අඩු වීමෙන් සිදු වූයේ කුමක් ද ?

(ලකුණු 02 × 05 - 10 යි)

05. පහත දැක්වෙන විස්තරය පදනම් කොට ගෙන **අත් පත්‍රිකාවක්** සකස් කරන්න. (මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)

සදගල කනිටු විදුහලේ දරුවෝ සිතුවම් නිර්මාණයට විශිෂ්ට දස්කම් දක්වන්නෝ වෙති. විදුහල්පතිතුමා විසින් එම දරුවන් ඇගයීම සඳහා චිත්‍ර ප්‍රදර්ශනයක් පැවැත්වීමේ කටයුතු කලා සංගමය වෙත පවරන ලදී. එම කලා සංගමයේ මූලිකත්වයෙන් 2023.04.25 දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේ දී පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා ප්‍රදර්ශනය පැවැත්වීම, එදින දර්ශනීය සිතුවම් අලෙවිය හා විශේෂ වට්ටම් යටතේ චිත්‍රපොත්, පාට පෙට්ටි ලබාගත හැකි වීම ආදි කරුණු ඇතුළත් කරමින් ප්‍රදේශවාසින් දැනුවත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න. චිත්‍ර ප්‍රදර්ශනය සඳහා සුදුසු තේමාවක් ද යොදන්න.

**නැතහොත්**

පහත සඳහන් විස්තරය පදනම් කරගෙන **වෙළෙඳ දැන්වීමක්** සකස් කරන්න. (වචන 100 කින් පමණ)

ඔබ ප්‍රදේශයේ බහුල ව ඇති පළතුරු හා එළවළු වර්ග භාවිතයෙන් විවිධ කල් තබා ගත හැකි දේශීය ආහාර වර්ග නිෂ්පාදනය කර දේශීය හා විදේශීය වෙළෙඳ පොළට අලෙවි කිරීමට ග්‍රාමීය මට්ටමින් ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට එක්තරා දේශීය ආයතනයක් අදහස් කර ඇත.
අඩු ආදායම්ලාභීන්ට ආදායම් උපයා ගැනීමට හැකි මෙම නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා සුදුසු නමක් ද මෙවැනි නිෂ්පාදන භාවිතයෙන් පාරිභෝගිකයාට ලැබෙන වාසි ද ග්‍රාමීය මට්ටමින් මෙම ව්‍යාපෘතියේ නියැලෙන්නන්ට වන වාසි ද නිෂ්පාදනයෙන් පසු අලෙවි පහසුකම් සැලසීම ආදිය ද සඳහන් කරමින් ආකර්ෂණීය වෙළෙඳ දැන්වීමක් සකස් කරන්න.

(ලකුණු - 15 යි)

PAST PAPERS WIKI